Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**08 ශ්‍රේණිය** තෙවන වාර පරීක්ෂණය - 2022(2023) **21 S**

නම: ............................................ **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය දෙකයි**

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **01 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ඇතැම් ව්‍යාපාරිකයන් <u>දෙපිටකාට්ටු වැඩ</u> කරමින් අනුන් රවටති.
ඉහත වාක්‍යයේ ඉරි ඇඳි පදයට සමාන අර්ථයක් ඇති පදය තෝරා යටින් ඉරක් අඳින්න.
(i) ඉතා හොඳින් වැඩ කරමින් (ii) දෙපැත්තටම හොඳින් වැඩ කරමින්
(iii) දෙපැත්තම මුලා කරමින් (iv) ඉතා සෙමින් වැඩ කරමින්

02. සෑම වචනයක ම මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති පද පේළිය වන්නේ,
(i) ශිෂ්ටාචාරය, ව්‍යාකරණ, සම්භාවනා (ii) ඡායාරූප, රෝග විනිශ්චය, ඝනත්වය
(iii) ප්‍රතිඵලය, උපස්ථානය, සංඛ්‍යාව (iv) සංග්‍රාමය, බන්ධනාගාරය, කර්තව්‍යය

03. නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පද පේළිය වන්නේ,
(i) නිශ්ශබ්ද, දියුණුව, ලේඛම් (ii) සඟකිරණ, අක්ෂර, බාදාව
(iii) වදාළ, ආභරණ, අවශේෂ (iv) ජෝෂ්ඨ, දුෂ්ඨ, කනිෂ්ඨ

04. අකාරාදී පිළිවෙළට යෙදී ඇති වරණය වන්නේ,
(i) අපේ ගම, බව තරණය, මඩොල් දූව, කරුවල ගෙදර
(ii) එත්ටැමෙන් පොළොව, එකම කථාව, රතු රෝසමල, ජීවන සුවඳ
(iii) කුවේණි, නරි බෑණා, මනමේ, සිංහබාහු
(iv) නන්ද ජාතකය, තිත්තිර ජාතකය, සකුණ ජාතකය, බක ජාතකය,

05. ගැටය සහිත ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය හා යංශය පිළිවෙළින් යෙදී ඇති පද පේළිය වන්නේ,
(i) මෘදු, රැල්ල, රූල, ව්‍යාඝ්‍ර (ii) ගෞරවය, නූල, රූස්ස, ක්‍රමය
(iii) තෘණ, රූප, රළ, ත්‍යාගය (iv) ත්‍යාගය, රෑන, පෑළ, පත්‍රය

06. ''ගුරු බැවුලේ <u>යව</u> අවුලේ නොවී කිසි'' යන පාඨයේ ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ,
(i) මිශ්‍ර ක්‍රියා (ii) විධි ක්‍රියා (iii) ආශිර්වාද ක්‍රියා (iv) පූර්ව ක්‍රියා

07. තද්ධිත නාමයක් වන්නේ,
(i) හැකියා (ii) දේශිය (iii) දුවන්නී (iv) කම්කරු

08. ක්‍රියා විශේෂණයක් වනනේ,
(i) කාලීන (ii) ගස්වැල් (iii) වේගවත් (iv) සුදන

09. බහ්වර්ථ පද පමණක් යෙදී ඇති වරණය වන්නේ,
(i) සත්, ශක්‍ර, චක්‍ර, අක්ෂි (ii) දද, දැඩි, අඟුන, පක්ෂි
(iii) ප්‍රිය, තරු, පාද, පියාපත් (iv) තුරු, ගස්, ඇතා, නාග

10. පරාස්ස, නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
(i) රෝහණ දන්දෙණිය මහතා (ii) දයාන්නද ගුණවර්ධන මහතා
(iii) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා (iv) හෙන්රි ජයසේන මහතා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**11 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

11. පහත සඳහන් පද සඳහා සමානාර්ථ පදය බැගින් ලියන්න.
    i. ශාලුක ........................................ ii. පිළිමල් .........................................

12. ................................................ මිහිරි ගීතයක් ගයන්නී ය. (ශිෂ්‍යයා/ ශිෂ්‍යාව)

13. ඔබ දක්ෂයෙක් .......................................... (වන්නෙහි/ වන්නේය)

14. බැතිමත්හු ........................................... පුදති. (දෙවියන්/ දෙවියෝ)

15. පහත සඳහන් පදවල අරුත් ලියන්න.
    (i) පුරාජේරුව - (ii) නස්පැත්තිය -

16. නිවැරදි ලෙස විරාම ලකුණු යොදා නැවත ලියන්න.
    අවසර මහ රජතුමනි මුළු රටම අවදානම් තීරණාත්මක අවස්ථාවකයි පසුවන්නේ එබඳු වෙලාවක

17. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
    (i) ඌන - (ii) සුහද -

18. පහත සඳහන් පදවලට තනිපදය බැගින් ලියන්න.
    (i) අංග පහකින් සමන්විත වූ - (ii) බොහෝ කලෙක සිට පැවතෙන

19. නිවැරදිව පද බෙදා ලියන්න.
    ඇතැම්බරණිමීටර1.3පමණඋසැතිමීටර්0.8ක්තරම්විශාලවනබවදනිගමනයකෙරිණි.

20. පහත සඳහන් කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කර ලියන්න.
    දෙරණ පළා රතු කැට මතුවන්නට -
    අප අත දෙන තුරු බලා හිඳී -

## II කොටස

### ''ආ කොටස''

01. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

    (i) රුහුණු පුරවරයට අධිපති දෙවියන් හැඳින්වෙන නම් දෙකක් ලියන්න.

    (ii) ''වැසි වසිනා අහස අපි'' ගීතය රචනා කරන ලද්දේ කවුද?

    (iii) ශබ්ද නඟා කියවීමේ දී අනුගමනය කළ යුතු රීති දෙකක් ලියන්න.

    (iv) ''අලි වසුරුවලින් කඩදාසි මුදල් හා රැකියා'' යන ලිපිය ලියුවේ කවුරුන් ද?

    (v) පරාස්ස නාට්‍ය නිෂ්පාදනයට මුල් වූ කෘතිය කුමක් ද? (ල: 02x05=10)

02. පහත මාතෘකාවලින් එකක් තෝරා ගෙන 200ට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.
    (i) පරිසරය රැක ගනිමු.
    (ii) විදුලි අර්බුදය අවම කර ගන්නේ කෙසේ ද?
    (iii) බොදු පුනරුදයේ සෙන්පතියාණෝ
    වාදීභසිංහ මොහොට්ටි වත්තේ ගුණානන්ද හිමි
    (iv) වන පෙතක අසිරිය
    (v) මරු කැඳවන රිය අනතුරු (ල:20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

03. ඔබ පාසලේ ප්‍රධාන ශිෂ්‍යනායක / නායිකාව යැයි සිතන්න. ප්‍රධාන රැස්වීම් වාරයකදී නිවැරදි ඉරියව් පැවැත්වා ගෙන යාමේ වැදගත්කම යන මැයෙන් දේශනයක් පැවැත්වීමට දිස්ත්‍රික් සෞඛ්‍යය වෛද්‍ය නිලධාරීතුමාට පැමිණෙන ලෙස දන්වමින් යවන රාජකාරි ලිපියක් ලියන්න. (ල:10)

**ආ කොටස**

**ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

04. මෙම ප්‍රකාශ කා විසින් කා හට කියන ලද්දක් ද? කුමන අවස්ථාවේ ද? පාඩමේ නම ලියන්න.

(i) ''ඒක ඇත්ත මම කැමති උඹලාගේ කටෙන් ම මේවා අහන්න''

(ii) ''මොකක් ද ගේන්න කිව්වේ?''

(iii) '' මං ඇත්තම කියන්නං මගෙ පණ කෙන්ද යන්තං බේරුවොත් ඇති''

(iv) එහෙම දැනගෙන ඉන්න එක හොඳයි නේ ද?''

(v) ''ගොඩක් ඈත, අඩි සියයට වඩා ගැඹුරේ.'' (ල: 02x05=10)

05. පහත පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කරන කලට පව් මීරිය මීසේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිනිසේ
ඇඳින එපව් දුර ලන උප දේසේ
නුදුන මැනැවි තුන් දොර අවකාසේ

(i) මෙම පද්‍යයේ එන උපමාවක් ලියන්න.

(ii) දුක් විඳින විට දී එය දැනෙන්නේ කෙසේ ද?

(iii) පව් දුරලීමට දෙනු ලබන උපදෙස කුමක් ද?

(iv) පහත පදවල අර්ථය ලියන්න.

කලට -  දැඩි වෙයි -

මීරිය -  අවකාසේ -

(v) මෙම පද්‍ය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද? (ල: 02x05=10)

06. පහත දී ඇති වාක්‍යවල හිස්තැන් සඳහා සුදුසු ක්‍රියාපදය තෝරා ලියන්න.

(i) ඔබ කීකරු දරුවෙක් ................................... (වන්නෙහි/ වන්නේ ය)

(ii) ගොවියෝ උදෑසනින් ගොවිබිමට ................................... (යති/ යහු)

(iii) අපි තරඟයෙන් ජය ................................... (ලැබූහ/ ලැබීමු)

(iv) ගෙවිලිය ඇඹුල රැගෙන කුඹුරට ................................... (ගියා ය/ යති)

(v) ඈ මිහිරි ලෙස ගීයක් ................................... (ගැයුවා ය/ ගැයුවේ ය) (ල: 02x05=10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිංහල භාෂාව හා සාහිත්‍ය
# 08 ශ්‍රේණිය
# පිළිතුරු පත්‍රය
## I කොටස

01. (iii) 02. (iii) 03. (iii) 04. (iii) 05. (ii)
06. (ii) 07. (i) 08. (iii) 09. (i) 10. (i)

11. (i) ඕලු/ ඇඹුල
(ii) සතුරු/ රුපු/ ප්‍රතිමල්ලව/ ශත්‍රු/ පසමිතුරු

12. ශිෂ්‍යයාව 13. වන්නෙහි 14.දෙවියන් 15. (i) බොරු පුරසාරම (ii) විනාශය

16. ''අවසර මහ රජතුමනි, මුළු රට ම අවදානම්, තීරණාත්මක අවස්ථාවකයි පසු වන්නේ, එබඳු වෙලාවක ...

17. (i) පූර්ණ (ii) දුගඳ

18. (i) පංචාංගික (ii) චිරාගත

19. ඇතැම් බරණි මීටර 1.3ක් උසැති, මීටර් 0.8ක් තරම් විශාල වන බව නිගමනය කෙරිණි.

20. බලවු යොමා නෙත රටේ ම මාවත
අපේ අතින් ගොඩ නැඟෙන හැටි (ලෘ 02x20=40)

## II කොටස

(අ) කොටස

(01) (i) ස්කන්ධ කුමාරථ බරනෙත, ශරනවභව, කඳ කුමරු
(ii) මහගමසේකර මහතා
(iii) 1. අසා සිටින්නාගේ අවධානය යොමු කර ගැනීම.
2. විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවීම.
3. ඉහත දී ඇති කරුණුවලට අමතර ව දරුවන් ලියා ඇති පිළිතුරු ද සලකා බලන්න.
(iv) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සාවිත්‍රි රණසිංහ
(v) රන් කැකිර හා තවත් කතා (ලෘ 02x05=10)

(02)
(03) } අදාළ නිර්ණායකවලට ලකුණු ලබාදෙන්න.

(04) (i) ඒජන්ත උන්නාන්සේ විසින් මවට
පාඩමේ නම : කතා බහට අවධානය
(ii) කුස්සි අම්මා විසින් පියසේනට
පාඩමේ නම : අවුරුදු සිහිනය

(iii) පූර්ණක විසින් පුංචිරාලට
පාඩමේ නම : පරාස්ස
(iv) ගුණානන්ද හිමියන් විසින් ලොකු හාමුදුරුවන්ට
පාඩමේ නම : බොදු පුනරුදයේ සෙන්පතියාණෝ

(v) තරුණයෝ දෙදෙනෙක් විසින් පුරාවිද්‍යා නිලධාරීන්ට
පාඩමේ නම : සයුරු ගැබෙන් මතු වූ නැව (ලෘ 02x05=10)

(05) (i) මී පැණි සේ/ ගින්දර සේ
(ii) ගින්දර සේ
(iii) තිදොරින් වන අකුසල්වලින් වැළකීම
(iv) කලට - කාලයට
දැඩි වෙයි - දරුණු වී
මීරිය - මිහිරි වේ
අවකාසේ - ඉඩ / අවස්ථාව
(v) සුභාෂිතය (ලෘ 02x05=10)

(06) (i) වන්නෙහි (ii) යති (iii) ලැබීමු (iv) ගියා ය. (v) ගැයුවා ය

(ලෘ 02x05=10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# සිංහල භාෂාව හා සාහිත්‍ය
## 08 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය
## I කොටස

01. (iii) 02. (iii) 03. (iii) 04. (iii) 05. (ii)
06. (ii) 07. (i) 08. (iii) 09. (i) 10. (i)

11. (i) ඕලු/ ඇඹුල
(ii) සතුරු/ රුපු/ ප්‍රතිමල්ලව/ ශත්‍රු/ පසමිතුරු

12. ශිෂ්‍යයාව 13. වන්නෙහි 14.දෙවියන් 15. (i) බොරු පුරසාරම (ii) විනාශය

16. ''අවසර මහ රජතුමනි, මුළු රට ම අවදානම්, තීරණාත්මක අවස්ථාවකයි පසු වන්නේ, එබඳු වෙලාවක ...

17. (i) පූර්ණ (ii) දුගඳ

18. (i) පංචාංගික (ii) චිරාගත

19. ඇතැම් බරණි මීටර 1.3ක් උසැති, මීටර් 0.8ක් තරම් විශාල වන බව නිගමනය කෙරිණි.

20. බලවූ යොමා නෙත රටේ ම මාවත
අපේ අතින් ගොඩ නැඟෙන හැටි (ල: 02x20=40)

## II කොටස

(අ) කොටස

(01) (i) ස්කන්ධ කුමාරථ බරනෙත, ශරනවභව, කඳ කුමරු
(ii) මහගමසේකර මහතා
(iii) 1. අසා සිටින්නාගේ අවධානය යොමු කර ගැනීම.
2. විරාම ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවීම.
3. ඉහත දී ඇති කරුණුවලට අමතර ව දරුවන් ලියා ඇති පිළිතුරු ද සලකා බලන්න.
(iv) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සාවිත්‍රි රණසිංහ
(v) රන් කැකිර හා තවත් කතා (ල: 02x05=10)

(02)
(03)
} අදාළ නිර්ණායකවලට ලකුණු ලබාදෙන්න.

(04) (i) ඒජන්ත උන්නාන්සේ විසින් මවට
පාඩමේ නම : කතා බහට අවධානය
(ii) කුස්සි අම්මා විසින් පියසේනට
පාඩමේ නම : අවුරුදු සිහිනය

(iii) පූර්ණක විසින් පුංචිරාලට
පාඩමේ නම : පරාස්ස
(iv) ගුණානන්ද හිමියන් විසින් ලොකු හාමුදුරුවන්ට
පාඩමේ නම : බොදු පුනරුදයේ සෙන්පතියාණෝ

(v) තරුණයෝ දෙදෙනෙක් විසින් පුරාවිද්‍යා නිළධාරීන්ට
පාඩමේ නම : සයුරු ගැබෙන් මතු වූ නැව (ල: 02x05=10)

(05) (i) මී පැණි සේ/ ගින්දර සේ
(ii) ගින්දර සේ
(iii) තිදොරින් වන අකුසල්වලින් වැළකීම
(iv) කලට - කාලයට
දැඩි වෙයි - දරුණු වී
මීරිය - මිහිරි වේ
අවකාසේ - ඉඩ / අවස්ථාව
(v) සුභාෂිතය (ල: 02x05=10)

(06) (i) වන්නෙහි (ii) යති (iii) ලැබීමු (iv) ගියා ය. (v) ගැයුවා ය

(ල: 02x05=10)